සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

# Primary Piriven Year End Term Test - 2016

**5 වසර / Grade 5**

**භූගෝල විද්‍යාව** කාලය : පැය තුනයි
**Geography** Time: Three hours

❖ I වන හා III වන කොටස්වල ප්‍රශ්න සියල්ලටත් II වන කොටසින් තෝරාගත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## I - කොටස

**01.** කෙටි පිළිතුරු සපයන්න.

i. පාංශු ඛාදනයට බලපාන මානව ක්‍රියා හතරක් සඳහන් කරන්න.

ii. "බල ශක්ති පරිභෝජනය ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා ගත හැකි කාර්යක්ෂම පියවර වන්නේ විකල්ප බලශක්ති කෙරෙහි යොමුවීමයි." විකල්ප බලශක්ති මූලාශ්‍ර හතරක් නම් කරන්න.

iii. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ස්වභාවික වෘක්ෂලතා කලාප හතරක් දක්වන්න.

iv. පෘථිවියේ අභ්‍යන්තර ව්‍යුහය කොටස් කීයද ? ඒවා නම් කරන්න.

v. නායයෑම් අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් දක්වන්න.

vi. සංචාරක කර්මාන්තය නිසා රටකට ඇතිවන වාසි හතරක් දක්වන්න.

vii. ලෝකයේ ජනාධික ම ප්‍රදේශ හතරක් නම් කරන්න.

viii. කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ඉදි වූ ජලාශ හතරක් නම් කරන්න.

ix. ග්‍රිනිච් වේලාව පෙ.ව. 08.00 නම් නැගෙනහිර දේශාංශ $90^0$ පිහිටි ස්ථානයක වේලාව ගණනය කරන්න.

x. නැමිකඳු නිර්මාණය කෙටියෙන් පැහැදිලි කර උදාහරණ දෙකක් දක්වන්න.

(ලකුණු 4x10 = 40)

## II - කොටස

**02.** "වාණිජ බෝග වගාව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට මහත් වූ දායකත්වයක් සපයන කෘෂි කාර්මික කටයුත්තක් වී ඇත.''

i. ශ්‍රී ලංකාවේ වාණිජ කෘෂි කර්මය යටතේ,

(a) තේ වගාවට වැදගත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.
(b) රබර් වගාවට වැදගත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න. (ලකුණු 04)

ii.(a) ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනයට වැදගත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.
(b) ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය අඩු වීම කෙරෙහි මෑත කාලයේ බලපා ඇති හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

iii.(a) ශ්‍රී ලංකාව අපනයනය කරන ප්‍රධාන කුළු බඩු වර්ග දෙකක් නම් කරන්න.
(b) කුළු බඩු නිෂ්පාදනය දියුණු කිරීම මගින් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ලැබෙන පිටිවහල නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

**03.** “ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුව රටක ආර්ථිකයෙහි සෑම අංශයක් කෙරෙහි ම ඇති කරන්නේ අතිමහත් බලපෑමකි”

i. (a) ශ්‍රී ලංකාවේ මහා මාර්ග ප්‍රවාහනයේ දියුණුවට හා
(b) ශ්‍රී ලංකාවේ ගුවන් ප්‍රවාහනයේ දියුණුවට මෑතක දී ගත් ක්‍රියාමාර්ග **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

ii. ශ්‍රී ලංකාවේ වරාය පහසුකම් සංවර්ධනයට මෑත කාලයේ ගෙන ඇති ක්‍රියාමාර්ග **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05)

iii. වරාය පහසුකම් හා ගුවන් ප්‍රවාහන පහසුකම් දියුණු කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ලැබෙන පිටිවහල කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

**04.** i. (a) ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය වැඩිම දිස්ත්‍රික්කයක් ද,
(b) ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය අඩුම දිස්ත්‍රික්කයක් ද, පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 04)

ii. රටක ජන සංඛ්‍යා වර්ධනයට බලපාන සාධක **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. ජන සංක්‍රමණ නිසා රටකට ඇති වාසි හා අවාසි **දෙක** බැගින් වෙනවෙන ම පැහැදිලි කරන්න. (ලකුණු 06)

**05.** i. ලෝකයේ ව්‍යාපාරික තිරිඟු වගාව පැතිර ඇති රටවල් **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

ii. තිරිඟු වගාවට හිතකර භෞතික සාධක **තුනක්** ද, මානව සාධක **දෙකක්** ද, සඳහන් කරන්න. (ලකුණු 05)

iii. (a) ලෝකයේ තිරිඟු වගාව සම්බන්ධ නව ප්‍රවණතා දෙකක් දක්වන්න.
(b) අන්තර්ජාතික වෙළඳාමේ දී තිරිඟු වැදගත්වීමට හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 06)

**06.** i. ලෝක වෙළඳාමට විශාල වශයෙන් දායකවන ආසියාතික රටවල් **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

ii. ලෝක වෙළඳාමේ නව ප්‍රවණතා **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05)

iii. සංවර්ධනය වෙමින් පවතින රටවල් ලෝක වෙළෙඳාමේදී මුහුණපාන ගැටලු විසඳා ගැනීමට අනුගමනය කරන ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06)

**07.** i. ලෝකයේ විශාල ම නිවර්තන වර්ෂා වනාන්තර **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

ii. නිවර්තන වර්ෂා වනාන්තරවල විශේෂ ලක්ෂණ **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05)

iii. වන විනාශය මිනිසාගේ හා සතුන්ගේ පැවැත්මට අහිතකර ලෙස බලපාන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

**08.** i. ස්වභාවික සම්පත් යන්න හඳුන්වන්න. (ලකුණු 04)

ii. ස්වභාවික සම්පත් ලබා ගන්නා ආකාරය අනුව වර්ග දෙකකි. එම වර්ග **දෙක** නම් කර උදාහරණ **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 05)

iii. ක්ෂයවන සම්පත් **හතරක්** නම් කොට එසේ ක්ෂයවීමට බලපාන හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 06)

## III - කොටස

**09.** ඔබ වෙත සපයා ඇති 1:50000 සමෝච්ච රේඛා සිතියම පදනම් කරගෙන පහත සඳහන් දෑ සම්මත සංකේත වර්ණ යොදා ගනිමින් පිළිතුරු සපයන්න.

i. මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ කුමන භූ විෂමතා කලාපයකට අයත් දැයි ඔබ හඳුනා ගන්නේ ද? (ලකුණු 01)

ii. 01, 02, 03 මගින් නිරූපණය වන භූ ලක්ෂණ නම් කරන්න. (ලකුණු 03)

iii. H අක්ෂරයෙන් දැක්වෙන වගුරුබිම සම්මත සංකේත හා වර්ණයෙන් දක්වන්න. (ලකුණු 01)

iv. A B C යන නගර සම්බන්ධ කෙරෙන A ශ්‍රේණියේ මාර්ගය ඇඳ දක්වන්න (ලකුණු 02)

v. 4 $Km^2$ ක ව්‍යාප්තව ඇති වී වගා බිමක් ඇඳ දක්වන්න. (ලකුණු 02)

vi. අඩි 40 මගින් නිරූපණය වන සම ගැඹුරු රේඛාව නියමිත වර්ණයෙන් දක්වන්න. (ලකුණු 02)

vii. A නගරය ආශ්‍රිතව දක්නට ලැබෙන සංචාරක බංගලාව, පොලීසිය, විශේෂ ගොඩනැගිල්ල, ඉදිකළ ප්‍රදේශය සම්මත සංකේත වර්ණයෙන් දක්වන්න. (ලකුණු 02)

viii. සිතියම් ප්‍රදේශයේ දකුණු ප්‍රදේශය තුළ දියුණු කළ හැකි කර්මාන්ත හතරක් නම් කරන්න. (ලකුණු 02)

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

**5 වසර / Grade 5**

**භූගෝල විද්‍යාව**
**Geography**

විභාග අංකය :...............................................

- සමෝච්ච රේඛා සිතියම.




පරිමාණය 1 : 50,000

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |